www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

## යුද්ධය කරා තල්ලු වී යාමේ සන්ධිස්ථානයක්

# ශ්‍රී ලංකා විදේශ ඇමති ඝාතනය පිලිබඳ නොවිසඳුනු ගැටලු

**A turning point in the drift to war**
**Unanswered questions remain about the killing of Sri Lankan foreign minister**

**කේ. රත්නායක විසිනි**
**2006 මැයි 23**

ශ්‍රී ලංකාවේ මිලිටරිය සහ දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය අතර විවෘත යුද්ධය පැන නැගීමත් සමග යලි පරීක්ෂාවට ලක් කිරීමට කාලෝචිත සිද්ධියක් නම් යලි සිවිල් යුද්ධය කරා ගිය ලුහුටා යාමේ සන්ධිස්ථානයක් වූ, පසු ගිය වසරේ අගෝස්තු 12 දා රාත්‍රියේ නාඳුනන තුවක්කුකරුවකු විසින් ශ්‍රී ලංකාවේ හිටපු විදේශ ඇමති ලක්ෂ්මන් කදිරගාමර් ඝාතනය කිරීම යි.

දිවයිනේ උතුරේ හා නැගෙනහිර සුනාමියෙන් ව්‍යසනයට පත් ප්‍රදේශවලට ආධාර බෙදා හැරීම පිනිස ආන්ඩුවේ හා එල්ටීටීඊයේ ඒකාබද්ධ මන්ඩලයක් පිහිටුවීමේ සැලසුම්වලට එරෙහිව අසාර්ථක උද්ඝෝෂනයක යෙදෙමින් සිටි ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) සහ ජාතික හෙල උරුමයේ සිංහල අන්තවාදීන්ට මෙම ඝාතනය දේශපාලන වරදානයක් විය. පශ්චාත් සුනාමි මෙහෙයුම් කලමනාකරන ව්‍යුහය (පීටොම්ස්) සම්බන්ධ ගිවිසුම අත්සන් කිරීමට විරෝධය පාමින් ජවිපෙ ජූනි මස පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් (එජනිස) ඉවත් වූ අතර මෙම “පාවාදීමට” විරුද්ධව මහජන විරෝධතා සහ මහා වැඩ වර්ජනයක් ද කැඳවී ය.

කෙසේ වෙතත්, ජවිපෙ උද්ඝෝෂනය මුලුමනින් ම අසාර්ථක විය. 2004 දෙසැම්බර් 26 දා දෑවැන්ත සුනාමි රල පහරින් සිදු කෙරුනු ව්‍යසනය, සිය නිවාස, දේපොල සහ නෑ හිතවතුන් අහිමි වූ විපතට පත් ලක්ෂ සංඛ්‍යාත ජනයා සම්බන්ධයෙන් පුලුල් සහානුමතියක් නිර්මානය කර තිබුනි. වැඩ කරන ජනතාව සිය ජන වර්ගය, භාෂාව හෝ ආගම නොතකා, ව්‍යසනයට ලක් වූ වෙරලබඩ ප්‍රදේශ වෙත ආධාර රැගෙන දිව ආහ. මෙම ව්‍යසනය ජාතික භේදයන් සමහන් කර ගෙන කල් පවත්නා සාමයක් ස්ථාපිත කර ගැනීමට අවස්ථාවක් ලබා දී ඇතැයි ප්‍රකාශ කිරීම මගින් මහජන මනෝගතියට ප්‍රතිචාර දක්වීමට ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංගට හා මාධ්‍යවලට බල කෙරුනි.

එම පොරොන්දුව මුලුමනින් ම වංචා සහගත විය. කාලය ඉක්ම යාමත් සමග ම, ආන්ඩුව ඔප්පු කලේ විපතට පත් ජනයාට ප්‍රමානවත් ආධාර සැපයීමෙහි ලා තමන් අපොහොසත් බව යි. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් තවමත් ව්‍යසනයෙන් පසුව වසර එකහමාරකට ආසන්න කලකටත් පසුව ස්ථිර වාසස්ථාන නොමැතිව ජීවත් වේ. පාලක ප්‍රභූ කොටස්, නැගෙන සමාජ හා දේශපාලනික අසහනයට මුහුන දුන් කල ඔවුන් සෑම විට ම කලාක් මෙන්, මෙම තත්වයට ප්‍රතිචාර දක්වූයේත් කම්කරු පන්තිය ජන වාර්ගික හා ආගමික රේඛා ඔස්සේ භේද කරලනු පිනිස වාර්ගික ආතතීන් ඇවිලවීම මගිනි.

එබැවින්, දේශපාලන හා මාධ්‍ය සංස්ථාපිතය, ජවිපෙ සහ හෙල උරුමය පෙරමුනේ ඇතිව. කදිරගාමර් ඝාතනය ක්ෂනිකව ගසා කෑවේ එල්ටීටීඊය ඝාතකයන් ලෙස හෙලා දැකීමට හා දෙමල විරෝධී මනෝගතීන් ඇවිලවීමට යි. සාක්ෂ්‍ය මගින් තහවුරු නොකෙරුනු මෙම චෝදනාව ප්‍රශ්න කිරීමට ලක් කල ඕනෑම අයෙක් එල්ටීටීඊයේ ඉත්තන් ලෙස හෙලා දකින ලදි. කදිරගාමර්ගේ මරනයට පෙර ඔහු පිලිබඳව විවේචනශීලී වූ පුවත්පත් එල්ටීටීඊයට සහාය දෙන්නන් ලෙස හෙලා දකින ලදි. හදිසි නීතිය වහාම සම්මත කරනු පිනිස පාර්ලිමේන්තුවේ දී සියලුම ප්‍රධාන පක්ෂ එකට එකතු විය.

පාලක කව තුල පැවති පොදු යුද ඝෝෂාව මධ්‍යයේ, ශ්‍රේෂ්ඨාධිකරනය, කුමාරතුංගට පසෙකට යාමට බල කරමින්, ජනාධිපතිවරනය පැවැත්විය යුතු කාලය සම්බන්ධයෙන් දිගු කලක් තිස්සේ පැවති මතභේදය ඉක්මනින් ම විසඳාලී ය. එජනිස මහින්ද රාජපක්ෂගෙන් ඇයව විස්ථාපනය කල අතර ඔහු ජවිපෙ හා හෙල උරුමය සමග මැතිවරන ගිවිසුම් ඇති කර ගැනීම මගින් නොවැම්බර් මැතිවරනයෙන් යන්තම් ජය ගති. එල්ටීටීඊයට එරෙහිව වඩා ආක්‍රමනශීලී ආස්ථානයක් ගන්නා ලෙස කෙරුනු ඉල්ලීම් එම ගිවිසුම්වලට ඇතුලත් විය. මැතිවරනයේ සිට මේ දක්වා, දෙපාර්ශ්වය ම “එල්ටීටීඊය සහ මිලිටරියේ කොටස්වලින් හා එයට අනුබද්ධිත දෙමල පැරා-මිලිටරි කන්ඩායම්වලින් තැනුනු රහස් සන්ධානයක්” විසින් සිදු කරනු ලබන

ප්‍රචණ්ඩ ප්‍රහාර සහ ප්‍රතිප්‍රහාර රට පූර්න පරිමාන යුද්ධයක අභියසට ඇද ගෙන එන මට්ටමට උත්සන්න වී ඇත.

එහෙත් කදිරගාමර් ඝාතනය සම්බන්ධයෙන් සිදු වී ඇත්තේ කුමක්ද? ඝාතනය පිලිබඳව නොවිසඳුනු ගැටලු ගනනාවක් ම පවතින බව පෙන්වා දුන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවිය මුලුමනින් ම පාහේ තනිවම ය. එල්ටීටීඊයේ ප්‍රතික්ෂේප කිරීම් තිබිය දී ම එය ඝාතනය සම්බන්ධයෙන් වගකිව යුතු වීමේ හැකියාව බැහැර නොකරමින් ම, ලෝසවෙඅ පෙන්වා දුන්නේ ඝාතනයෙන් පැහැදිලිව ම වඩාත්ම දේශපාලන වාසි ලැබූවන් -- මිලිටරියේ ඉහල කොටස් සහ ජවිපෙ හා හෙල උරුමය වැනි ස්වෝත්තමවාදී සංවිධාන -- සියල්ලන්ට ම ප්‍රචණ්ඩ ප්‍රකෝපකරන පිලිබඳ දීර්ඝ ඉතිහාසයක් තිබෙන බව හා ඔවුන්ගෙන් ඕනෑම පාර්ශ්වයක් මෙම අපරාධය සිදු කිරීමේ බෙහෙවින් ඉඩකඩක් ඇති බව ය.

ඝාතනයෙන් නව මසක් ගෙවී ගිය තැන ගැටලු තවමත් නොවිසඳී පවතී. එල්ටීටීඊය වගකිව යුතු බවට කෙරෙන ඒකාන්ත ප්‍රකාශ තිබිය දී ම, ආන්ඩුව වත් පොලීසිය වත් සිය චෝදනා ඔප්පු කිරීමට කිසිදු සාක්ෂ්‍යයක් සපයා නැත. ඝාතනයෙන් මසකට පසුව, සන්ඩේ ටයිම්ස් පත්‍රය සඳහන් කල පරිදි, ඝාතනයට එල්ටීටීඊයේ සම්බන්ධය පිලිබඳ චෝදනා තහවුරු කරන නිල වාර්තාවක් විදේශ ආන්ඩුවලට කරුනු පැහැදිලි කරනු පිනිස එතෙර පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලට බෙදා හැර ඇත. කෙසේ වෙතත්, මෙම වාර්තාව කිසිදාක ප්‍රසිද්ධ කෙරී නැත.

ඝාතනය පිලිබඳ සිද්ධීන්ට ලැබුනු ප්‍රසිද්ධියේ දීප්තිය තුල, පොලීසිය සහ මාධ්‍ය, ප්‍රකාශ ගනනාවක් ම සිදු කල නමුත් ඒවා එක්කො සාවද්‍ය බව හෝ නොමග යවන සුලු නැත හොත් ප්‍රතිවිරෝධතාවන්ගෙන් යුක්ත බව ඔප්පු විය. නිදසුනක් ලෙස, තමන් අත් අඩංගුවට ගත් අවස්ථාවක දී පාවිච්චි කරනු පිනිස සියලු එල්ටීටීඊ සටන්කරුවන් විසින් පැලඳ සිටින, සයනයිඩ් කරල් කිහිපයක් එම ස්ථානයේ තිබී සොයා ගත් බව ප්‍රකාශ කල පොලීසිය විසින් ම එම ප්‍රකාශ ඉක්මනින් ම ඉවත දමන ලදි. කෙසේ වෙතත්, අනතුරු මාස ගනනාව තුල දී, සිදු වන පොලිස් පරීක්ෂන හෝ රටේ බල පවත්වන දරුනු හදිසි නීති රෙගුලාසි යටතේ චෝදනා හෝ නඩු විභාග නැතිව රඳවා ගෙන සිටින සැකකරුවන් සත් දෙනාගේ ඉරනම හෝ පිලිබඳ මාධ්‍ය ආවරනයක් නොතිබුනු තරම් ය.

## නොවිසඳුනු ගැටලු

ඝාතනය පිලිබඳ තොරතුරු තවමත් අතිශයින් ම සීමිත ය. කදිරගාමර්ට වෙඩි තබන ලද්දේ, අගෝස්තු 12 දා රාත්‍රියේ කොලඹ නගර මධ්‍යයේ ධනවතුන් වෙසෙන ප්‍රදේශයක් වන බුලර්ස් පාරේ පිහිටි සිය නිවහනේ පිහිනුම් තටාකයක පිහිනීමෙන් පසුව 10.45ට පමන ය. එදින ඔහු රැස්වීමකට සහභාගි වූ හෙයින් රෑ බෝ වී ආපසු නිවහනට පැමින තිබුනි. ඔහු වහාම රෝහලට ගෙන යන ලද නමුත් එහි ලඟා වී මද වේලාවකින් මිය ගියේ ය.

ආන්ඩුවේ වඩාත් ම ජ්‍යෙෂ්ඨ ඇමතිවරයකු ලෙස කදිරගාමර්ට, විශේෂ පුහුනුවක් ලද ඇමති ආරක්ෂක අංශයේ (එම්එස්ඩී) සාමාජිකයන්ගෙන් සමන්විත ඔහුට ම වෙන් වූ ආරක්ෂක වැඩපිලිවෙලක් තිබුනි. එහෙත් පෙනී ගිය කරුනක් නම්, තුවක්කුකරුවකුට වාසි සහගතව යොදා ගත හැකි ස්ථාන කදිරගාමර්ගේ නිවහන අවට තිබේ දැයි පරීක්ෂා කිරීමේ මූලික පූර්වාරක්ෂක පියවර පවා ගැනීමට ඔහුගේ ආරක්ෂකයන් අසමත්ව ඇති බව යි.

පොලීසියට අනුව, තුවක්කුකරුවන් ලක්ෂ්මන් තලෙයිසිංහම් නමැති අයෙකුට අයත් අසල්වැසි නිවසක ඉහල මාලයේ දින ගනනාවක් තිස්සේ කඳවුරුලා ගෙන සිට ඇත. දෙමල ජාතිකයකු වන තලෙයිසිංහම්ට හෝ ඔහුගේ ඥාතීන්ට එල්ටීටීඊය සමග සබඳතා තිබූ බවටත් ඔවුන් කුමන්ත්‍රනයට සම්බන්ධිත බවටත් චෝදනා කෙරුනු ආවේගාත්මක කතන්දර එම අවස්ථාවේ දී ප්‍රසිද්ධියට පත් විය. පොලීසිය ඔහුගෙන් ප්‍රශ්න කරන ලද අතර ඔහු ඔවුන්ට කියා සිටියේ තමන් කිසිදාක ඉහල මාලය පාවිච්චි නොකල බව යි. ඔහු රඳවා ගැනුනු අය අතර නැත.

එම්එස්ඩී ආරක්ෂක කන්ඩායම සහ පොලීසිය ඝාතකයන් අල්ලා ගැනීමට අපොහොසත් වීම මගින් පෙන්නුම් කල අසාමාන්‍ය නොතැකීම පිලිබඳ පැහැදිලි කිරීමක් කිසිදාක ඉදිරිපත් නොකෙරුනි. ආරක්ෂකයෝ ඝාතකයන් අල්ලා ගැනීමට කිසිදු ප්‍රයත්නයක් නොදැරූහ. පොලීසිය ප්‍රදේශයේ මාර්ග බාධක යෙදීමට අඩු ගනනේ පැය දෙකක් ගත්තේ ය. තලෙයිසිංහම් අධිකරන පරීක්ෂනයකට කියා සිටියේ පොලීසිය ඔහුගේ නිවසට පැමිනියේ පාන්දර 1ත් 2ත් අතර බව යි. මෙම හැසිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඝාතකයන්ට ලෙහෙසියෙන් ම පැන යාමට හැකි විය.

ඝාතනය හොඳින් සැලසුම් කල එකක් බවට කිසිදු සැකයක් නැත. එහෙත් එහි ස්වභාවය එල්ටීටීඊයේ සුපුරුදු ක්‍රියා පිලිවෙත නොවේ ය. එල්ටීටීඊයේ සලකුන වී ඇත්තේ, 1999 දී ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග ඝාතනය කිරීමට තැත් කල අවස්ථාව සහ යුද හමුදාපති ලුතිනන් ජෙනරාල් සරත් ෆොන්සේකාගේ ජීවිතය යන්තමින් බේරුනු අප්‍රේල් 25 දා කොලඹ යුද හමුදා මූලස්ථානයේ දී එල්ල කෙරුනු මෑත ප්‍රහාරය මෙන්, මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර ය. එල්ටීටීඊය සිය

සතුරන් ඝාතනය කිරීමට ස්නයිපර් තුවක්කුකරුවකු යොදා ගෙන ඇත්තේ කලාතුරකිනි.

පොලිස් පරීක්ෂන සිදු කරනු ලබන්නේ කොලඹ අපරාධ මර්දන අංශයේ (සීසීඩී) විශේෂ කන්ඩායමක් මගිනි. පරීක්ෂන ක්‍රියාදාමය තුල දී සැකකරුවන් සත් දෙනෙක් රඳවා ගෙන ඇත. පස් දෙනෙක් තවමත් රිමාන්ඩ් බන්ධනාගාරයක රඳවා ගෙන සිටින අතර දෙදෙනෙක් මාස ගනනාවක් රඳවා ගෙන සිට අවසානයේ ඇප මත නිදහස් කර ඇත. පස් දෙනාගෙන් ආරක්ෂක තර්ජනයන් මතු වන ප්‍රකාශ කර ඇති නමුත් ඒ පිලිබඳ කිසිදු හේතු සම්පාදනයක් සිදු කොට නැත. සෑම සති දෙකකට වරක් ම මහේස්ත්‍රාත් විනිසුරුවරයෙක් බන්ධනාගාරයට ගොස් ඔවුන්ගේ රැ දවුම් නියෝග දීර්ඝ කරයි.

සැකකරුවන් මෙසේ යෑ

" මුත්තයියා සහදේවන් යනු තලෙයිසිංහම්ගේ නිවස අසල නිවසක වැඩ කල උද්‍යාන සේවකයෙකි. ඔහු ඝාතකයන්ට තලෙයිසිංහම්ගේ නිවසට ඇතුලු වීමට ඉඩ දුන්නේ යැයි පොලීසිය කියා පායි. පසු ගිය වසරේ සන්ඩේ ටයිම්ස් වාර්තාවකට අනුව, කුමන්ත්‍රනයේ එල්ටීටීඊ සංවිධායක විනෝදන් සමග තමන් කතා කල බවට සහදේවන් " පාපොච්චාරනයේ" කොට ඇති අතර, සහදේවන්ට ජංගම දුරකතනයක් ද සපයා කෙතරම් නම් හොඳට මුදල් ගෙවා ඇති ද කිය තොත් ඔහු කොලඹ නාරහේන්පිටින් ඉඩමක් පවා මිලට ගෙන ඇත. එම පුවත් පතේ ම මෙම වසරේ පල වූ වාර්තාවකට අනුව, සීසීඩී දූන් කියා සිටින්නේ, විපාර්ශ්වික එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙක් ඝාතනයට වසරකටත් වඩා ඉහත දී සහදේවන්ට ඉඩම ප්‍රදානය කිරීමට කටයුතු කල බව යි. මෙම ප්‍රතිවිරෝධී වාර්තාවලින් එකක් වත් උසාවියේ දී කිසිදාක පරීක්ෂාවට භාජනය කෙරී නැත. ඔහුගේ නීතිඥයා ඇප ඉල්ලුම් පත්‍රයක් ගොනු කර ඇති අතර ඒ සම්බන්ධයෙන් තවමත් තීන්දුවක් ගැනීමට නියමිතව තිබේ.

" අරෝග්‍යනාදන් යනු ඝාතකයන්ට ආයුධ ප්‍රවාහනය කිරීමට උදව් දුන්නේ යැයි කියනු ලබන ත්‍රී-රෝද රථ රියදුරෙකි. තමන් විනෝදන්ට කතා කලේ යැයි ඔහු පාපොච්චාරනය කල බව ද පොලීසිය කියා පෑවේ ය. ඝාතනයට තමන්ගේ කිසිදු සම්බන්ධයක් නැති බව සිය සැමියා කියා ඇතැයි ඔහුගේ බිරිඳ සුබ්‍රමනියම් රන්ජනී *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* පැවසුවා ය. ඇය සහ ඇයගේ මස්සිනා ද රඳවා ගෙන පොලීසිය විසින් ප්‍රශ්න කරන ලද නමුත් දිනකට පසුව නිදහස් කරන ලදි. තම සැමියා අත් අඩංගුවට ගනු ලැබුවේ ඔහුගේ දුරකතන අංකය සහදේවන්ගේ ජංගම දුරකතනයේ සටහන්ව තිබීමේ හේතුව නිසාම පමනක් යැයි ඇයි පැවසුවා ය.

" තමිල් ඉනියම්, රෙන්ගන් පෙගනන් සහ අයියර් රාජ්කුමාර් යන තිදෙනා ජුලි 30 දා කදිරගාමර්ගේ නිවහන අසල ඡායාරූප ගනිමින් සිටිය දී අත් අඩංගුවට ගන්නා ලදි. ඔවුන් එල්ටීටීඊය සහ එහි ඝාතක කන්ඩායම වෙනුවෙන් ඔත්තු බැලීමේ යෙදී සිටිය බවට පොලීසිය චෝදනා කරයි. කෙසේ වෙතත්, මෙම චෝදනා පැහැදිලි ප්‍රශ්නයක් මතු කරයි. පොලීසිය සහ එම්එස්ඩීය එල්ටීටීඊයේ ක්‍රියාකාරකම් ගැන සෝදිසියෙන් සිටියේ නම්, විදේශ ඇමතිගේ සහ එම ප්‍රදේශයේ වෙනත් ඕනෑම අයෙකුගේ ආරක්ෂාව සහතික කරනු පිනිස ඝාතනයට දින 13ක් පෙරාතුව ඔවුන් ගත් ක්‍රියාමාර්ග මොනවා ද?

" සිවරාසන් සිවරන්ජන් සහ කේ. තිරුකුමාර් ජංගම දුරකතන අලෙවිකරුවන් වන අතර ඔවුන් අත් අඩංගුවට ගන්නා ලද්දේ පසු ගිය සැප්තැම්බරයේ දී ය. කදිරගාමර්ගේ ඝාතකයාට සිම් කාඩ් පතක් ලබා දුන් අලෙවිකරුවකුට සිම් කාඩ් අලෙවි කලේ සිවරන්ජන් යැයි පොලීසිය චෝදනා කරයි. පෙබරවාරි 24 දා මහාධිකරනයේ නියෝගයකින් සිවරන්ජන් ඇප මත නිදහස් කරන ලදි. ඔහු රඳවා ගැනීම " හිතුවක්කාරී සහ අසාධාරන" යැයි ප්‍රකාශ කරන ලෙස අධිකරනයෙන් ඉල්ලමින් ගොනු කොට ඇති ඔහුගේ මූලික අයිතිවාසිකම් පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරනයේ දී විභාගයට ගැනීමට නියමිත ය. තිරුකුමාර් ඔහුගේ බිරිඳ විසින් ගොනු කරන ලද පෙත්සමකට ප්‍රතිචාර වසයෙන් පසු ගිය අප්‍රේල් මාසයේ දී මහාධිකරනය විසින් ඇප මත නිදහස් කරන ලදි. ඔහුට එල්ටීටීඊය සමග කිසිදු සම්බන්ධයක් නැතැයි ද වෙනත් සැකකරුවකුට සිම් කාඩ් පතක් අලෙවි කලා පමනක් යැයි ද ඇය අවධාරනය කලා ය.

මෙම රැඳවියන් සම්බන්ධයෙන් පවත්නා කැපී පෙනෙන ලක්ෂනය නම්, ඔවුන් කෙසේ හෝ සිද්ධියට සම්බන්ධ යැයි සැලකුවත් ඔවුන් කුමන්ත්‍රනයේ වාටියේ සිටින අය වීම යි. කුමන්ත්‍රනයේ මහ මොලකාරයා යැයි කියනු ලබන විනෝදන් අත් අඩංගුවට ගෙන නැති අතර තුවක්කුකරුවා හෝ තුවක්කුකරුවන් ද අල්ලා ගෙන නැත. මෙම කිසිදු සැකකරුවකු එල්ටීටීඊ සාමාජිකයන් බව පෙනී ගොස් ද නැත. ඔවුන් ඝාතනය සැලසුම් කිරීමට සහභාගි වූයේ නම්, එල්ටීටීඊය හැර වෙනත් අයෙකුට ද ඔවුන් පහසුවෙන් ම යොදා ගත හැකිව තිබුනි.

පරීක්ෂනයේ සැකකටයුතු ස්වභාවය එක් ඉහල පෙලේ පුද්ගලයකු අත් අඩංගුවට ගැනීමේ සිද්ධිය මගින් වඩාත් ම විචිත්‍ර ලෙස අවධාරනය වෙයි. එනම් ඕස්ට්‍රේලියානු පුරවැසි භාවය සහිත වයස්ගත දෙමල ව්‍යාපාරිකයකු වන චාල්ස් ඥානකෝන් ය. ඔහු කදිරගාමර් පුද්ගලිකව දැන සිටි අතර වාර්තා වන පරිදි, ඔහුව එල්ටීටීඊය ද හඳුනන අතර එල්ටීටීඊය වෙත පනිවිඩ ගෙන යන

නිල නොවන මාර්ගයක් ලෙස විදේශ ඇමතිවරයා ඔහුව යොදා ගෙන තිබේ. කදිරගාමර් ඇමති තනතුරේ සිටින තාක් කල් එල්ටීටීඊය ඔහුව ඝාතනය නොකරනු ඇතැයි ඔහුට පැවසීම මගින් ඥානකෝන් ඇමතිවරයා සිය ආරක්ෂාව සම්බන්ධයෙන් සාවද්‍ය තක්සේරුවකට තල්ලු කිරීමට හිතාමතාම කටයුතු කර ඇතැයි චෝදනා කරමින් මාධ්‍ය කෝපාන්විත උද්ඝෝෂනයක් ගෙන ගියේ ය. ඔක්තෝබර් 10 දා ඔහු අත් අඩංගුවට ගනු ලැබුවේ පොලීසිය මගින් නොව, මිලිටරි ඔත්තු සේවා නිලධාරීන් කන්ඩායමක් විසිනි.

පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානයටත් එහි අපේක්ෂක මහින්ද රාජපක්ෂටත් පසු ගිය නොවැම්බර් ජනාධිපතිවරනයේ දී සාර්ථක තුරුම්පුවක් ලැබුනි. ඥානකෝන් රාජපක්ෂගේ ප්‍රතිවාදියා වූ විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ ද පුද්ගලිකව දූන සිටියෙකි. ඥානකෝන් කදිරගාමර් ඝාතනයේ සැකකරුවකු වූ බැවින් එයින් ව්‍යුත්පන්න වන කරුන නම් වික්‍රමසිංහ ද එයට සම්බන්ධිත බව යි. කොලඹ මාධ්‍ය තුල කිසිවෙක් හෝ පැහැදිලි ප්‍රශ්නය මතු කලේ නැත: එනම්, එල්ටීටීඊය කදිරගාමර්ගේ ආරක්ෂාව සහතික කොට තිබූ බව සත්‍යය නම්, එවිට විදේශ ඇමතිවරයා ඝාතනය කලේ කවුද?

මැතිවරනයෙන් එතරම් කලක් යාමට මත්තෙන් ඥානකෝන් නිදහස් කරන ලදි. ඔහුගේ ඕස්ට්‍රේලියානු මිතුරකු වන ඩැනියෙල් ඩි ස්මෙට්, හබයාස් කෝප්පුස් ඉල්ලුම් පත්‍රයක් ගොනු කරමින්, මිලිටරි ඔත්තු සේවා නිලධාරීන් තම නිවසට බලහත්කාරයෙන් ඇතුලු වී "ත්‍රස්තවාදීන්ට රැකවරන සපයන්" බවට තමන්ට අභූත චෝදනා එල්ල කොට නීති විරෝධී ලෙස ඥානකෝන් අත් අඩංගුවට ගත්තේ යැයි චෝදනා කලේ ය. ඝාතනයට ඥානකෝන්ගේ සම්බන්ධය දක්වන කිසිදු සාක්ෂ්‍යයක් තමන් සතුව නැතැයි නොවැම්බර් 28 දා අධිකරනයේ දී කියා සිටීමට සීසීඩී අධ්‍යක්ෂ සරත් ලූගොඩට බල කෙරුනි. නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් ජේ.එස්. ජයසිංහ ලූගොඩගේ ප්‍රකාශය තහවුරු කලේ ය.

ඝාතකයාගේ තුවක්කුව පිලිබඳ දිගට ඇදුනු ප්‍රශ්නය ද තවමත් නොවිසඳී පවතී. පොලීසිය අපරාධය සිදු කල ස්ථානයේ තිබී ශක්තිමත් ඇලුමිනියම් තෙපාවක් සොයා ගෙන ඇති නමුත් තුවක්කුවක් සොයා ගෙන නැත. කදිරගාමර් ඝාතනය කරන ලද්දේ විශේෂිත ස්නයිපර් තුවක්කුවකින් යැයි ඔවුන් ආරම්භයේ කියා සිටියේ, තලෙයිසිංහම්ගේ නිවසේ ඉහල මාලයේ සිට කදිරගාමර්ගේ ගෙවත්තට ඇත්තේ සන්සන්දනාත්මකව කෙටි දුරක් -- මීටර් 40ක් පමන -- වීම ද නොතකා ය. රජයේ රස පරීක්ෂකයන් නිගමනය කලේ පහසුවෙන් සොයා ගත හැකි මැෂින් තුවක්කුවක් ඝාතනයට යොදා ගෙන ඇති බව යි.

තමන් කොලඹ සිට කිලෝ මීටර් 64ක් පමන දුරින් පිහිටි මහවැව කුඹුරක තිබී මැෂින් තුවක්කුවක්, ග්‍රෙනේඩ් සහ වෙඩි උන්ඩ සහිත අතහැර දමා ගිය මල්ලක් සොයා ගෙන ඇතැයි ඔක්තෝබර් මාසයේ දී පොලීසිය නිවේදනය කලේ ය. මෙම ස්වංක්‍රීය ගිනි අවිය කදිරගාමර් ඝාතනයට යොදා ගන්නා ලදුව පලා යන ඝාතකයන් විසින් අතහැර දමා යන ලද්දක් යැයි සමපේක්ෂනය කිරීමකට මාධ්‍ය පැන ගති. විශේෂ කාර්ය බලකායේ (එස්ටීඑෆ්) අන දෙන නිලධාරි නිමල් ලෙව්කේ කියා පෑවේ ඒ පිලිබඳව "සියයට 90ක් ම සහතික" බව යි. එහෙත් සීසීඩී අධ්‍යක්ෂ ලූගොඩ වඩා පරෙස්සම් සහගත වෙමින් කියා සිටියේ ඒ සඳහා ප්‍රක්ෂේප (බැලිස්ටික්) පරීක්ෂනයක් අවශ්‍ය බව යි. ආයුධය සොයා ගත් පොලිස් නිලධාරීන් "ඇඟිලි සලකුනු සාක්ෂ්‍ය ආරක්ෂා කර ගැනීමට ප්‍රමානවත් පූර්වාරක්ෂක පියවර" ගැනීමට අසමත්ව ඇති බව ද ලූගොඩ සඳහන් කලේ ය.

සීසීඩී නිලධාරීන් පෙබරවාරි 10 දා අධිකරනයට දැනුම් දුන්නේ, ආයුධය ඝාතනයට යොදා ගෙන ඇත්දැයි නිර්නය කර ගැනීමේ පරීක්ෂන අවසන් කෙරී නැති බැවින් තවත් කාලය අවශ්‍ය බව යි. කෝපයට පත් මහේස්ත්‍රාත්වරයෙක් තදින් මෙසේ ප්‍රකාශ කලේ ය: "කදිරගාමර් මහතා ඝාතනය කල ආයුධය (එය ද කියා) සොයා ගැනීමට තවත් වසරක් ගත වේවි. එවිට එය නඩුවට කිසිදු ප්‍රයෝජනයක් නොවනු ඇත." මතු කල යුතුව තිබූ ප්‍රශ්නය නම්: තුවක්කුව කදිරගාමර්ගේ සිරුරෙන් ලබා ගත් මූනිස්සම් සමග සැසඳීමේ සාපේක්ෂ වසයෙන් ඍජු ප්‍රක්ෂේප පරීක්ෂනයක් සිදු කිරීමට එතරම් දිගු කලක් ගෙන ඇත්තේ ඇයි ද?

ලෝක සමාජවාදී වෙබ් අඩවිය අප්‍රේල් අග දී නීතිපති දෙපාර්තමේන්තුව අමතා මෙම පරීක්ෂනය පිලිබඳව විමසූ කල අතිරේක සොලිසිටර් ජෙනරාල් ඩබ්ලිව්.පී.ජී. ඩෙප් පැහැදිලි කලේ, පරීක්ෂන තවමත් සිදු වන බව හා පොලීසිය තවමත් මහේස්ත්‍රාත් විනිසුරුවරුන් වෙත වාර්තා ඉදිරිපත් කරන අතර එබැවින් මේ අවස්ථාවේ කිසිදු චෝදනාවක් ගොනු කොට නැති බව යි.

## ඝාතනයේ දේශපාලනය

කදිරගාමර් ඝාතනය එල්ටීටීඊයේ ක්‍රියාවක් වීම විය හැක්කකි. ඇමතිවරයා එල්ටීටීඊයේ දිගු කාලීන විරුද්ධවාදියෙකු වූ අතර ම සාම සාකච්ඡා පොරොන්දු වෙමින් 1994 දී බලයට පැමිනීමෙන් පසුව ක්ෂමා විරහිත ලෙස සිවිල් යුද්ධය ගෙන ගිය ජනාධිපති කුමාරතුංගගේ සමීප සහයෝගිකරුවෙක් හා විශ්වාසවන්තයෙක් විය. විදේශගත පුලුල් දෙමල ජන ප්‍රජාවෙන් එල්ටීටීඊයට ලැබෙන දේශපාලන හා ද්‍රව්‍යමය සහයෝගය කපා හරිමින් එල්ටීටීඊය "ත්‍රස්තවාදී" සංවිධානයක් ලෙස හංවඩු ගැසීමේ ජාත්‍යන්තර උද්ඝෝෂනයක් ගෙන

යාමෙහි ලා කදිරගාමර් කැපී පෙනෙන ක්‍රියාකලාපයක් ඉටු කර තිබුනි. එල්ටීටීඊයට පෙනෙන පරිදි, කදිරගාමර් ද්‍රෝහියෙකි.

කෙසේ වෙතත්, පසු ගිය අගෝස්තුවේ දී එල්ටීටීඊය වඩාත් උත්සුක වූයේ යුද්ධයක් අරඹනවාට වඩා පීටොම්ස් ගිවිසුම ක්‍රියාවට දැමීම සහතික කර ගැනීම ගැන ය. මහ බලවතුන්ගේ පිටුබලය ලැබුනු මෙම ගිවිසුම එල්ටීටීඊය ප්‍රසිද්ධියේ සහයෝගය දක්වූ සාම සාකච්ඡා යලි පන ගැන්වීමේ ප්‍රථම පියවර ලෙස සැලකුනි. පීටොම්ස් ගිවිසුම එල්ටීටීඊ පාලන ප්‍රදේශවල වෙසෙන වඩ වඩා අසරන භාවයට හා හුදකලාවට ලක් වෙමින් සිටින දෙමල ජනතාව වෙත අත්‍යවශ්‍ය ආධාර සම්පාදනය කිරීමටත් එමෙන් ම එල්ටීටීඊයට යම් ජාත්‍යන්තර පිලිගැනීමක් ප්‍රදානය කිරීමටත් නියමිත විය. එම හේතුව නිසා, ජවිපෙ, ජාතික හෙල උරුමයේ හා මිලිටරියේ ඉහල කොටස්වල සිංහල අන්තවාදීහු එය "පාවාදීමක්" ලෙස සඳහන් කරමින් ගිවිසුමට දැඩි ලෙස විරුද්ධ වූහ.

ඝාතනය ගැන කෙරෙන පරීක්ෂනයේ දිගට ඇදෙන හා අවිනිශ්චිත ස්වභාවය මගින් මතු කෙරෙන්නේ හුදෙක් පොලීසියේ අසමත්කම පිලිබඳ ප්‍රශ්නය පමනක් නොව, සැබෑ තතු යට ගැසීම පිලිබඳ ප්‍රශ්නයකි. පීටොම්ස් ගිවිසුමේ, සටන් විරාම ගිවිසුමේ හා ඊනියා සාම ක්‍රියාදාමයේ විරුද්ධවාදියකු විසින් ඝාතනය සිදු කරනු ලැබීමේ සැබෑ හැකියාව පිලිබඳව කිසිදු විමසා බැලීමක් කෙරී නැත. ඝාතනයෙන් පසුව ක්ෂනිකව ම අතිශයින් එලිදරව් කරන සුලු ආකාරයේ අදහස් දැක්වීමක් කරමින්, ජනාධිපති කුමාරතුංග ඝාතනය පිලිබඳව චෝදනා කලේ එල්ටීටීඊයට නොව "ගැටුමේ සාමකාමී පරිවර්තනයකට විරුද්ධ දේශපාලන සතුරන්ට" ය.

ඊට සහමුලින් ම වෙනස් ප්‍රකාශයක් කිරීමට දින දෙකකට පසුව කුමාරතුංගට බල කෙරුනු නමුදු, ඇය කිසි දාක සිය ආරම්භක ප්‍රකාශය ගැන පැහැදිලි කිරීමක් කලේ නැත. පීටොම්ස් ගිවිසුමට මිලිටරියේ ඉහල කොටස් දක්වන සතුරු භාවය ද උතුරේ හා නැගෙනහිර ප්‍රකෝපකරනයන්ට සන්නද්ධ හමුදාවල සහභාගිත්වය ද ගැන ආරක්ෂක ඇමති මෙන් ම ජනාධිපති ලෙස ඇය හොඳින් දැන සිටියා ය. කෙසේ වෙතත් කුමාරතුංග ම, 2003 දී, ඇයගේ පක්ෂය ආන්ඩුවෙන් පිටත සිටින විට, සාම සාකච්ඡා බිඳ වැටීමට දායක වූ නාවික ක්ෂේත්‍රයේ සිද්ධීන් මාලාවක් ම සැලසුම් කරනු පිනිස මිලිටරියේ ඉහල කොටස් සමග කුමන්ත්‍රනය කොට තිබුනි.

එල්ටීටීඊය කදිරගාමර් ඝාතනය සිදු නොකලේ නම්, පැහැදිලි විකල්ප සැකකරුවා වනු ඇත්තේ, ඒ සඳහා ගාමකයක්, අවස්ථාවක් හා විධි ක්‍රම සහිත මිලිටරියේ කොටස ය. දෙමල ජාතිකයකු හා සාම ක්‍රියාදාමයේ අද්වකාත්වරයකු වූ කදිරගාමර්ට මිලිටරියේ ඉහල නිලධරය වෙතින් කිසිදාක ඉහල ගෞරවයක් ලැබුනේ නැත. විශේෂයෙන් ම මිලිටරි ඔත්තු සේවාවන්ට, එල්ටීටීඊ විරෝධී විවිධ දෙමල පැරා-මිලිටරි කන්ඩායම් සමග දිගු කාලීන සබඳතාවක් පවතින අතර, ඔවුහු එම කන්ඩායම් එල්ටීටීඊ නායකයන් ඝාතනය ඇතුලු විවිධාකාර කැත මෙහෙයුම්වලට යොදා ගෙන ඇත. එල්ටීටීඊය විසින් සිදු කල ඝාතනයක් මෙන් පෙනෙන පරිදි, දෙමල සන්නද්ධ කන්ඩායමක් යොදා ගෙන මිලිටරියේ කන්ඩායමක් විසින් සංවිධානය කරන ලද ඝාතනයකට ප්‍රසිද්ධියට පත්ව ඇති සාක්ෂ්‍ය සියල්ල ම මැනවින් ගැලපෙයි.

ජවිපෙ හා හෙල උරුමය සමග බැඳුනු සිංහල අන්තවාදීන්ගේ සම්බන්ධයක් ද බැහැර කල නොහැකි ය. මෙම සංවිධානවලට ප්‍රචන්ඩ වාර්ගික ප්‍රකෝපකරනයන්ගෙන් හා ආරක්ෂක හමුදාවන් සමග පවත්නා සබඳතාවන්ගෙන් යුක්ත ඉතිහාසයක් ඇත. එපමනක් නොව, දශක දෙකක් තිස්සේ සිවිල් යුද්ධය තුල ගිලී පවතින රටක් තුල, ආයුධවල කිසිදු හිඟයක් නැත, බොහෝ සෙයින් සන්නද්ධ හමුදා හැර ගිය අය ඇතුලු මංමුලාවට පත් පුහුනු ඝාතකයන්ගේ ද අඩුවක් නැත. කදිරගාමර් ඝාතනය කලේ කවුද යන වග පැහැදිලි නැත. එහෙත් පොලිස් පරීක්ෂන දිගට ඇදීම කොතෙක් දුරට සිදු වන්නේ ද එල්ටීටීඊය හැර වෙනත් පාර්ශ්වයක් ඝාතනයට වගකිව යුතු වීමට ඇති ඉඩකඩ ද ඒ තරමටම වැඩි වේ.

ඝාතනයෙන් වාසි ලැබුවේ කවුරුන් ද යන වග පැහැදිලිව ම නිශ්චිත ය. ආරක්ෂක තත්වයක සිටි ජවිපෙ හා හෙල උරුමය, දේශපාලන වාතාවරනය එල්ටීටීඊ විරෝධී හා දෙමල විරෝධී හිස්ටීරියාවකින් විෂ කරමින්, ආක්‍රමනශීලී ආස්ථානයක් ගත්හ. ඔවුන්ගේ පිටුබලය ඇතිව රාජපක්ෂ තේරී පත් වීමෙන් පසුව, රට ඉක්මනින් ම යලි යුද්ධය දෙසට ලුහුටා ගොස් තිබේ. පීටොම්ස් ගිවිසුම ඉක්මනින් ම අතහැර දමුනු අතර, එල්ටීටීඊ ආධාරකරුවන් හා එයට සහානුමතිය දක්වන්නන් ඝාතනය කිරීම වාර්ගික මනෝගතීන් අවුලුවා පලි ගැනීමේ ප්‍රහාර සඳහා එල්ටීටීඊය පොලඹවා ඇති තතු යටතේ, සටන් විරාමය අවලංගු ලියවිල්ලක් බවට පත්ව ඇත. දිවයින පූර්න පරිමාන යුද්ධයක් තුලට යලි තල්ලු කිරීමට සූදානම් වන කොලඹ දේශපාලන සංස්ථාපිතයට, එම ප්‍රතිගාමී එල්ලයන් හඹා යනු පිනිස තමන්ගේ අයකු බිල්ලට ගැනීමේ හැකියාව උවමනාවටත් වඩා ඇත.

© www.wsws.org